 ISSN 2362-0412

# මත්සුව බෂෝගේ හයිකු කාව්‍ය නිර්මාණවල බහුශාබ්දික ගුණය

Ven. Aparekke Sirisudhamma

*Department of Sinhala, Faculty of Humanities and Social Sciences, University of Ruhuna, Sri Lanka*

Corresponding author: sudhaaparekke@gmail.com

‘හයිකු’ යනු මාත්‍රා 17කින් (5-7-5) යුත් ජපන් කාව්‍ය සම්ප්‍රදායේ හමුවන කෙටිම කාව්‍ය ආකෘතියකි. එය ක්‍රි.ව. 7වන සියවසයේ සිට 12වන සියවස දක්වා මාත්‍රා 31කින් (5,7,5,7,7) යුත් තන්ක, රෙන්ගා, හයිකායි, හොක්කු යන කාව්‍ය සම්ප්‍රදායන් ඇසුරෙන් පෝෂණය වූවකි. හයිකු කවිය සෙන් දහමේ ආභාසයෙන් ස්වාධීන, විශිෂ්ට හා දාර්ශනික අගයෙන් යුත් කාව්‍ය ආස්ථානයක පිහිටුවන ලද්දේ මත්සුවෝ බෂෝ (Matsuo Bashō ක්‍රි.ව. 1644-1694) කවියා විසිනි. තවද බහුශාබ්දිකත්වය (polyphony) යනු මිඛායෙල් බක්තීන් විසින් වඩාත් පැහැදිලි කරන ලද සාහිත්‍ය නිර්මාණවල අර්ථය හා සෞන්දර්ය කියවීමේදී වැදගත්වන න්‍යායික සංකල්පයකි. සාහිත්‍ය නිර්මාණයක එන කථන නොහොත් ශබ්ද හා සිදුවීම් කතුවරයාගේ මැදිහත්වීමකින් තොරව රසිකයාට ඇසෙන්න සැලැස්වීම බහුශාබ්දිකත්වයයි. එය කතුවරයා විසින් චරිත හා සිද්ධි ගැන පැහැදිලි කිරීමකින් නොව පාඨකයා විසින් නිර්මාණයේ චරිත හා සිද්ධි පැහැදිලි කරගැනීමෙන් උපදින්නකි. එනම් කතුවරයාගේ මැදිහත් වීමකින් තොරව පාඨකයාට නිර්මාණය රසවිඳීමට ඇති හැකියාවයි. කතුවරයා සිදු කරන්නේ නිර්මාණයෙහි සැලැස්ම හා රාමුව අප්‍රකාශිත ව්‍යූහමය තලයක රැඳවීමයි. නිර්මාණයක ව්‍යූහය (රාමුව) සහ ආකෘතිය යනු දෙකකි. ආකෘතිය යනු අන්තර්ගතය බහාලන භාජනයක් වැනි දෙයකි. එහෙත් රාමුව යනු අන්තර්ගතය බහාලන්නක් නොවේ. නිර්මාණයේ කලාත්මකභාවයේ සහ සෞන්දර්යයේම කොටසකි. එහිදී එක් ආකෘතියක විවිධ රාමු නොහොත් අප්‍රකාශිත ව්‍යූහ කිහිපයක් තිබිය හැකිය. (උදාහරණ වශයෙන් දැව යනු ආකෘතියකි. එකී දැව යන ආකෘතිය යටතේ පුටු, අල්මාරි, මේස, ඇඳන් ආදි විවිධ රාමු නිර්මාණය කරගත හැකිය. නිර්මාණයකද එවැනි ව්‍යූහ කිහිපයක් පැවතිය හැකිය.) එය හදිස්සිකාර පාඨකයන්ට නොපෙනෙන්නකි. කතාවෙහි කලාත්මක බව හා සෞන්දර්ය උපදින්නේ වහා නොපෙනෙන හොඳින් සැලසුම් කර නිපදවන ලද අප්‍රකාශිත ව්‍යූහ හේතුවෙනි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ නූතනයේ පරිසේවිත මෙම න්‍යායික සංකල්පය මත්සුවෝ බෂෝ කාව්‍ය නිර්මාණ ඇසුරෙන් අධ්‍යයනය කිරීමයි. බහුශාබ්දිකත්වය යනු කුමක්ද? එම න්‍යාය මත්සුවෝ බෂෝගේ හයිකු කාව්‍ය විචාරයට යොදාගත හැක්කේ කෙසේද? යන්න මෙහි පර්යේෂණ ගැටලුය. මත්සුවෝ බෂෝ තෝරාගත් හයිකු කාව්‍ය නිර්මාණ හා බහුශාබ්දිකත්වය යන න්‍යායික සංකල්පය මෙහි පර්යේෂණ සීමාවයි. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණයකි. මත්සුවෝ බෂෝගේ නිර්මාණ, හයිකු කවිය හා බහුශාබ්දිකත්වය සම්බන්ධයෙන් ලියවුණු න්‍යායික කෘති මෙහි ප්‍රාථමික මූලාශ්‍රය වන අතර පුස්තකාලය හා අන්තර්ජාල මූලාශ්‍රය ඔස්සේ ඒ සඳහා කරුණු ගවේෂණය කරනු ලැබේ.

*ප්‍රමුඛ වචන: අප්‍රකාශිත ව්‍යූහය, බහුශාබ්දිකත්වය, මත්සුවෝ බෂෝ, සැලැස්ම හා රාමුව, හයිකු කාව්‍ය*